## පරිසරය සුරකිමු!

සෙතක් දෙන්නෙ පරිසරේ
විපත් දෙන්නෙ පරිසරේ
රැකුමට මතු පරපුරේ
එක්වෙමු අපි සුමිතුරේ

බොරදිය ඇත කැළතුණු
සැම තැනම කැළි කුණු
ගංවතුරෙන් වැනසුණු
පරිසරයකි මැළවුණු

වියලි බවකි සැම දෙසේ
වැහි අඳුරක් නොම දිසේ
තෙතමනයක් නැත පසේ
සැම වත සිත නොම තොසේ

කඩොලාන ද තේ වතු
වැල් තුරු වදුලෙන් යුතු
දැනගෙන මේ ගැන තතු
රැකගත යුතු මින් මතු

♦ **වෙනුර දිසානායක**
ආනන්ද මහා විද්‍යාලය
කොළඹ Sri Lanka


## තරු සිසී

කරුවල ඇතිවිට එළියට එන්නයි
එළිවන විට යළි සැඟවෙන්නයි
තරු පැටවුනි කවුරුන්දෝ කිව්වේ
එළියට ඔතරම් බයවෙන්නයි

දහසක් තරු වැල් එකවිට ආ මුත්
කණාමැදිරි එළියකි දෙන්නේ
පෝදා නැග එන එක පුන්සඳ දැක
ලොවකම ගණඳුරු දුරුවෙන්නේ

දහසක් තරු මැද එක එක තරුවක්
වෙන්කර හඳුනා ගනිමු කෙසේ
එද ඒ තරු මැද බබළන පුන් සඳ
ලොව හැම දෙනුවන් වලට දිසේ

♦ **ඩබ්. එම්. මධුෂිකා කල්පනි**
ජනාධිපති විද්‍යාලය
මිනුවන්ගොඩ Sri Lanka



**Children's Corner**

## Wedding Superstitions මංගල්‍ය මිත්‍යා විශ්වාස

It is said to be unlucky if the bridegroom saw the bride in her wedding dress before she walks up the aisle toward him for the marriage service. Also it is said to be bad luck for the bride to see herself in a looking glass in her complete wedding outfit. A superstitious bride would put on her gloves after she has turned away from the glass. Perhaps this belief stems from the age-old idea that if you see yourself mirrored in a glass, or in a pool, you leave part of your self behind in the reflection.

මනමාලිය මංගල ඇඳුමෙන් සැරසී පල්ලියට ඇතුල්ව අල්තාරය වෙත පිය නගන මොහොතේ දී මිස, ඇය කලින් මංගල ඇඳුමෙන් සැරසී සිටිනු මනාලයා විසින් දකිනු ලැබීම අසුබ බව කියැවේ. එසේම සම්පූර්ණ මංගල ඇඳුමෙන් සැරසුණු මනාලියක් කණ්ණාඩියකින් ඇගේ රූපය නැරඹීම ද අසුබ පල දෙන බව කියති. මෙම මිත්‍යාව විශ්වාස කරන මනාලිය කරන්නේ කණ්ණාඩියෙන් ඉවත්වූ පසුව සිය සුදු අත්වැසුම් පැළඳීමයි. අතීතයේ කිසිවෙකු කැඩපතකින් හෝ පොකුණක ජලයෙන් මුහුණ බැලුවොත් ඔහු හෝ ඇය තමාගෙන් කොටසක් සිය ඡායාව සමග තබා යන බවක් පිළිගෙන තිබිණ.

♦ ***Auntie Ramani*** (**රමණී නැන්දා**)

## අවුරුද්දේ අවසානය

කැලැන්ඩරේ එක කොළයයි තියෙන් නේ
එම මස දෙසැම්බරයයි අපි කියන් නේ
පෘථිවිය සූර්යයා වට ගොස් නිමවන් නේ
තව ටික දිනයකින් වසරක් නිමවන් නේ

නොදැනිම දවස් තුන්සිය හැටපහක් ගියා
වසර පුරා මා නිති ප්‍රයොජන ලැබුවා
දෙදහස් නවය අවුරුද්දට පිය මනිනා
සැම දෙනාට බත බුලතින් සරු වේවා

ලබන වසර සුබ නව වසරක් වේවා
සාමය සතුට පිරි නව වසරක් වේවා
ජයෙන් ජයම ලද නව වසරක් වේවා
මගේ කවිය මේ වසරෙම පල වේවා

**2008 දෙසැම්බර්**

| Sun | Mon | Tue | Wed | Thu | Fri | Sat |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 |
| 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 |
| 28 | 29 | 30 | 31 | | | |

♦ **ර. ඉඳුමිණි සජානි**
ශාන්ත තෝමස්
උසස් බාලිකා විදුහල
මාතර Sri lanka


**BOC**

**ලංකා බැංකුව**
**BANK OF CEYLON**

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

**ලන්ඩන් ශාඛාව**

**වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.**

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC ගිණුමක් අරඹන්න !**
*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගත-කර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**


**මා කැමති ඔබ කැමති ✲ ගීයක්**

# සඳකිඳුරා මියගියා........ ගමට එන්න නංගියේ.....!




**රත්න ශ්‍රී විජේසිංහ**

සඳ කිඳුරා මිය ගියා
ගමට එන්න නංගියේ
පහළොස්වක පෝය දා
අවසන් කටයුතු කළා

ගමේ නාඩගම් පොළේ
කිඳුරිය වී නුඹ එදා
ගැයු ලිය ගී විකුණන්නට
කොළොම් තොටට ඉගිලුණා
කණ කෙකිනිය ගමට ඇවිත්
ඇඬුවා නුඹ ගැන කියා

වෙල් දෙවියෝ සිටි පුරා
තනිවම සීපද කියා
තනිව සිටිය කින්නරා
ලය දැදුරුව මියගියා
කණ කෙකිනිය හඬන්නෙ නෑ
ඇහේ කඳුළු නැති නිසා



**ජානක වික්‍රමසිංහ**



**විශාරද ගුණදාස කපුගේ**

**මෑ**ත කාලයේ දී අපට අසන්නට ලැබුණු ඉතා හැඟුම් බර, ඇඩුම් බර ගීයක් ලෙස ඉහතකී ගීතය බොහෝ දෙනා පිළිගෙන ඇති බව වැටහේ. සිතට කාවදින, යම් පමණකට සිත සසල කරවන මෙම ගීතයේ පද රචනය ප්‍රවීන ගීත නිබන්ධකයෙකු හා කවියෙකු වන රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ය. ප්‍රවීන ගායන ශිල්පි ජානක වික්‍රමසිංහ ගීතය ගායනා කරයි. මෙම ගීතයේ තනුව හා සංගීත නිර්මාණය අභාවප්‍රාප්ත විශාරද ගුණදාස කපුගේ සංගීතඥයාගෙනි.

යෞවන ප්‍රේමය තුළ සැඟවී ඇති අවිනිශ්චිත හා විශ්වාස කළ නොහැකි බව බොහෝ විට පෙනෙන්නේ දෛවයට අනුව සිදුවන සිද්ධීන් ඇසුරෙනි. ආදරයක් කැඩී ගියද බොහෝ විට එය වේදනා දෙමින් මතකය තුළ බොහෝ වාරයක් ඒ මේ අත යන්නේ ය. ඇතැම් විට එය ඉතා ඛේදනීය ලෙස අවසන් වන්නේ ය.

ගීතයේ පදවලින් කියන පරිදි අතීතයේ ගම්වල තිබූ නාඩගම් මඩු සිහියට නැගේ. මෙවැනි එක් ගමක සඳ කිඳුරු නාඩගම රඟ දැක්වූ අතර කිඳුරා හා කිඳුරියගේ චරිතයන් නිරූපණ ය කරන ලද්දේ ඒ ගමේම විසූ තරුණයෙකු හා තරුණියක විසිනි. ඒ නාට්‍ය රඟපෑම්වලින් ඔවුන් දෙදෙන අතර පෙම් සබඳකමක් ද හටගන්නට ඇති බව වැටහේ.

සඳකිඳුරු නාටකයේ වැඩි බර එන්නේ කිඳුරියගේ චරිතයටය. වනයට පැමිණෙන රජු කිඳුරියගේ රූපයට ඇති ආශාවෙන් ඇය නතුකරගනු පිණිස දුන්නෙන් විද කිඳුරා මරාදමන්නේය. ඉන්පසු කිඳුරිය සිය ස්වාමියාට අත්වූ ඉරණම මත හඬා වැළපෙන්නට පටන් ගනී. සඳකිඳුරු නාඩගමේ උච්චම අවස්ථාව මෙයයි. මෙහිදී ඒ කිඳුරියගේ වැළපීම ගීතයක් ලෙසින් නාටකයේ ගායනා කෙරේ. ඒ ගායනය බොහෝ විට නාටකය බලන අයගේ ඇසට කඳුළු නංවන්නට සමත්වෙයි.

ඉහත ගී පදවලින් හැඟවෙන කතාව මෙසේ වෙයි. කිඳුරිය ලෙස රඟපෑ ගමේ තරුණියට හොඳ ගායනා කුසලතාවක් තිබුණි. ඒ නිසා ඇයට තැටි හා කැසට් සඳහා ගී ගයන්නට ද ඉල්ලීම් එන්නට ඇත. ඇය ඒ අළුත ලැබූ ජනප්‍රියත්වයෙන් මත්ව කොළඹ යන්නට ඇත්තේ ඒ නිසාය. ඇය ඒ කරන්නට යන දේට ගමේ කිඳුරු පෙම්වතා විරුද්ධ වූවත් ඇය ඒ නොතකා සිදාදියට ගියාය. එහිම රැඳුණාය ආපහු ආවේ නැත. මෙය පැරණි ගම්බද ජීවිතය වාණිජකරණය වීමේ ප්‍රතිපලයයි.

ඇය සිදාදියේ ගෙවන ජීවිතය ගැන අසුබ ආරංචි ගමට ටිකෙන් ටික එන්නට පටන් ගත්තේය. එය ගමට කණකොකා හඬන්නට පටන්ගත්තා වැනිය. ගොවි තරුණයෙකු වූ ගමේ කිඳුරු පෙම්වතා ඒ ආරංචි වලින් කම්පා වූවාට සැක නැත. ඒ ආරංචි ඇත් තද බොරුද යන්න සොයා බලන් නට විදියක් ඔහුට නොවීය. ඔහු තනිවම ඒ සියල්ල විඳ දරා ගනිමින් කුඹුරේ වැඩ කළේය.

අවසානයේ ඔහු හද පැලී මිය ගියේය. සඳකිඳුරු ජාතකයේ ද දැක්වෙන්නේ කිඳුරාගේ පපුවට විදින ලද හී පහරකින් ඔහු මිය ගිය බවයි. මේ ගමේ තරුණයාගේ මරණ යද එවැනිම ලය සිදුරුවීමකි. කාත් කවුරුවත් නැති තනිව විසූ ඔහු ගේ අවසන් කටයුතු ගම්වාසීන් එකතුව පහළොස්වක පෝය දින සිදුකර ඇත. මේ සියල්ලේ යථා තත්වය දන්නා තරුණියගේ සොහොයුරා ඇයට මේ මළගම දන්වා යවයි. මිය ගිය තරුණයා ගමේ හැඳින් වුණේ සඳකිඳුරා යන නමිනි. " සඳකිඳුරා මැරුණා උඹ දැන්වත් ගමට වරෙන් නංගියේ " යයි සොහොයුරා කියයි.

රත්න ශ්‍රී විජේසිංහ ලියා ඇති බොහෝ විරහ ගීත හිතේ දුක සංකාව දනවයි. මෙයද එවැනි එක් ගීයකි. ඔහු යොදා ඇත්තේ ගමේ කතාකරන බස්වහරයි.

එසේම විශාරද ගුණදාස කපුගේ යොදා ඇති තනුව ද එය දිගහරින සංගීතය ද ශ්‍රාවකයාගේ හද ශෝක යෙන් කම්පනය කරන සුලුවෙයි.

ජානක වික්‍රමසිංහගේ ගැඹුරු ලයාන්විත කටහඬ ඉතා උචිත ලෙස මෙම ගීතයෙන් කියැවෙන අරුත තීව්‍රව සහෘදයාට දනවයි. මෙය පද, සංගීතය හා ගායනය ඉතා මනාව මිශ්‍රවී ඇති ගීයක් බව නිසැකය.

♦ ***තමාරා ඉලංගකෝන්***
**Slough, Berks UK**


***Srilanka Information Site ශ්‍රී ලංකා තොරතුරු අඩවිය***
**www.srilankans.com**